
# ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව



**මූලික වාර්තාව**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්**

**මාර්තු 2024**

# අන්තර්ගතය

හැඳින්වීම ........ 1
ක්‍රමවේදය ........ 2
විධායක සාරාංශය ........ 3
ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය ........ 3
ආයතන පිළිබඳ විශ්වාසය ........ 3
සංහිඳියා සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය ........ 3
බලය බෙදීම ........ 3
නිරාගාමික ව්‍යවස්ථාව ........ 3
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය ........ 4
සුළුතරය - බහුතරය අතර සබඳතා ........ 4
සමාජ විශ්වාසය ........ 5
සුළු ජාතීන් සඳහා වන දේශපාලන ආරක්ෂාව ........ 5
ජාතික ගීය ගායනා කිරීමේ භාෂාව ........ 5
සිහි කිරීමට ඇති නිදහස ........ 6
සොයාගැනීම් ........ 7
ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය ........ 8
ප්‍රස්තාර 1 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ජාතික ........ 8
ප්‍රස්තාර 2 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ජනවාර්ගිකත්වය ........ 8
ප්‍රස්තාර 3 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස ........ 9
ආයතන පිළිබඳ විශ්වාසය ........ 9
ප්‍රස්තාර 4 - ආයතන පිළිබඳ විශ්වාසය - ජාතික ........ 9
වගුව 1 - ආයතන පිළිබඳ විශ්වාසය - ජනවාර්ගිකත්වය ........ 10
සංහිඳියාව පිළිබඳ ප්‍රගතිය ........ 10
ප්‍රස්තාර 5 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ජාතික ........ 10
ප්‍රස්තාර 6 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ජනවාර්ගිකත්වය ........ 11
ප්‍රස්තාර 7 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස ........ 11
බලය බෙදීම ........ 12
ප්‍රස්තාරය 8 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ජාතික ........ 12
ප්‍රස්තාරය 9 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ජනවාර්ගිකත්වය ........ 12

ප්‍රස්තාරය 10 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස................13
ප්‍රස්තාරය 11 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ජාතික.......................................13
ප්‍රස්තාරය 12 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ජනවාර්ගිකත්වය .......................14
ප්‍රස්තාරය 13 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස........14
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය**..........................................15
ප්‍රස්තාරය 14 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ජාතික................................15
ප්‍රස්තාරය 15 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය..................15
ප්‍රස්තාරය 16 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස..16
ප්‍රස්තාරය 17 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ජාතික .......................................................16
ප්‍රස්තාරය 18 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය ........................................17
ප්‍රස්තාරය 19 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ........................17
ප්‍රස්තාරය 20 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ජාතික..................................................18
ප්‍රස්තාරය 21 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ජනවාර්ගිකත්වය ................................18
ප්‍රස්තාරය 22 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ................19
**සුළුතරය - බහුතරය අතර සබඳතා** ..............................................................................................19
ප්‍රස්තාරය 23 - ''මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි'' - ජාතික.....19
ප්‍රස්තාරය 24 - ''මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි'' - ජනවාර්ගිකත්වය..........................................................................................20
ප්‍රස්තාරය 25 -''මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි'' - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස.............................................................................................20
ප්‍රස්තාරය 26 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ජාතික ..........................................................................21
ප්‍රස්තාරය 27 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ජනවාර්ගිකත්වය...................................................................21
ප්‍රස්තාරය 28 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ............................................22
ප්‍රස්තාරය 29 - ඔබට හැඟෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ජාතික.............................................................................................22
ප්‍රස්තාරය 30 - ඔබට හැඟෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ජනවාර්ගිකත්වය..............................................................................23
ප්‍රස්තාරය 31- ඔබට හැඟෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස..............................................................23
ප්‍රස්තාරය 32 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ජාතික ...............................................................................................................24
ප්‍රස්තාරය 33 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ජනවාර්ගිකත්වය.........................................................................................................24

ප්‍රස්තාරය 34 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද?- ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ........ 25
ප්‍රස්තාරය 35 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ආගම ........ 25
**සමාජ විශ්වාසය** ........ 26
ප්‍රස්තාරය 36 - ඔබට පුද්ගලික උපකාරයක් උවමනා අවස්ථාවකදී, ඒවැනි උපකාරයක් ලබා ගැනීමට පහත සඳහන් කර ඇති පුද්ගලයින්ව ඔබ කොතරම් දුරට විශ්වාස කරනවා ද? - ජාතික ........ 26
ප්‍රස්තාරය 37 - ඔබට පුද්ගලික උපකාරයක් උවමනා අවස්ථාවකදී, ඒවැනි උපකාරයක් ලබා ගැනීමට පහත සඳහන් කර ඇති පුද්ගලයින්ව ඔබ කොතරම් දුරට විශ්වාස කරනවා ද? - ජනවාර්ගිකත්වය 26
**සුළු ජාතීන් සඳහා වන දේශපාලන ආරක්ෂාව** ........ 27
ප්‍රස්තාරය 38 - ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ජාතික ........ 27
ප්‍රස්තාරය 39 - ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ජනවාර්ගිකත්වය ........ 27
ප්‍රස්තාරය 40 - ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ........ 28
ප්‍රස්තාරය 41 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ජාතික ........ 28
ප්‍රස්තාරය 42 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ජනවාර්ගිකත්වය ........ 29
ප්‍රස්තාරය 43 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ........ 29
ප්‍රස්තාරය 44 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ජාතික ........ 30
ප්‍රස්තාරය 45 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ජනවාර්ගිකත්වය ........ 30
ප්‍රස්තාරය 46 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ........ 30
**ජාතික ගීය ගායනා කිරීමේ භාෂාව** ........ 31
ප්‍රස්තාරය 47 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ජාතික ........ 31
ප්‍රස්තාරය 48 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ජනවාර්ගිකත්වය ........ 32
ප්‍රස්තාරය 49 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස ........ 32
**සිහි කිරීමට ඇති නිදහස** ........ 33
ප්‍රස්තාරය 50 - සිහිකිරීමට ඇති නිදහස - ජාතික ........ 33
ප්‍රස්තාරය 51 - සිහිකිරීමට ඇති නිදහස - ජනවාර්ගිකත්වය ........ 33
ප්‍රස්තාරය 52 - සිහිකිරීමට ඇති නිදහස - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස ........ 33

# හැඳින්වීම

මෙම මූලික වාර්තාව මගින් 2024 ජනවාරි මාසයේදී සිදු කරන ලද ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව පිළිබඳ සමීක්ෂණයේ සොයාගැනීම් ඉදිරිපත් කරයි. මෙම මත විමසුම තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාවට අදාළ මූලික කාරණාවන් කිහිපයක් පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගනී. එසේ කිරීමෙන්, මෙම අධ්‍යයනය අරමුණු කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව යන පුළුල් මාතෘකාව යටතේ සිදුවන කතිකාව කෙරෙහි සාමාන්‍ය ජනතාවට තමන්ගේ ස්ථාවරය පිළිබිඹු කරමින්, ඔවුන්ට තමන්ගේ මතය ප්‍රකාශ කිරීමට වේදිකාවක් සැපයීමයි. අනෙක් අතට, අධ්‍යයනයේ අරමුණ වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඔවුන්ගේ තීරණ පෙළගැස්වීමේදී ජනතාවගේ වටිනාකම්, අපේක්ෂාවන් සහ කැමැත්ත උපයෝගී කරගැනීමට වැදගත් මූලාශ්‍රයක් ලෙස ක්‍රියාත්මක වීමයි. මෙම වාර්තාව මගින් වාර්ගික සබඳතා පිළිබඳ මහජන මතය, සමාජ හා දේශපාලන ක්ෂේත්‍රවල සුළු ජාතික ආරක්ෂාව, ජනවාර්ගික කණ්ඩායම් අතර විශ්වාසය සහ ඉවසීම, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන ආයතන සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මතය ද සාකච්ඡා කරනු ලබයි.

මෙම සමීක්ෂණය පවත්වන ලද්දේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසිනි. එය 1999 සිට ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටළු පිළිබඳව මහජන මත විමසුම් පවත්වයි. මෙහි සමීක්ෂණ කණ්ඩායම ආචාර්ය ප්‍රදීප් පීරිස්, රංගනී රණසිංහ, එම්. ක්‍රිෂ්ණමූර්ති සහ ඉෂාරා ජයරත්න යන අයගෙන් සමන්විත විය. මෙම අධ්‍යයනට දැක්වූ සහාය සඳහා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට, භවානි ෆොන්සේකාට සහ මෙම කටයුත්ත සිදුකිරීම උදෙසා අරමුදල් ලබා දුන් සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ ගෝලීය වැඩසටහන - Global Initiative for Justice Truth and Reconciliation (GIJTR) සංවිධානයට සෝෂල් ඉන්ඩිකේටර් විසින් ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු.

# ක්‍රමවේදය

දිස්ත්‍රික්ක 25ක් පුරා ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් - සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම් - තෝරාගත් පුද්ගලයන් 1350 කගේ නියැදියක් අතර අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් උපයෝගී කරගනිමින් සම්මුඛ සාකච්ඡා හරහා මෙම සමීක්ෂණය සිදු කරන ලදී. ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශයන්හි පුරුෂයින් සහ ස්ත්‍රීන් නියෝජනය සහතික කිරීම සඳහා බහු-අදියර අහඹු ස්ථරීයකරණ නියැදීමේ ක්‍රමවේදය භාවිතයෙන් නියැදි ස්ථාන තෝරා ගන්නා ලදී. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරට අයත් ක්ෂේත්‍ර සමීක්ෂකයන් (පුරුෂයින් සහ ස්ත්‍රීන්) 73 ක් සහභාගී කරගනිමින් ක්ෂේත්‍ර කටයුතු 2024 ජනවාරි 4 දින සහ 22 දින අතර පවත්වන ලදී. අවසාන දත්ත කට්ටලය ජනගහනයේ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික සැබෑ අනුපාතය පිළිබිඹු කිරීම සඳහා බර තබා ඇති අතර සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

## ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය

- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (76.7%) "ඕනෑම ආකාරයේ ආණ්ඩුක්‍රමයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය වඩාත් සුදුසුය" යන ප්‍රකාශය සමඟ එකඟ වේ. මෙය සියලුම ජනවාර්ගික ප්‍රජාවන්, ස්ත්‍රී පුරුෂභාවයන් සහ වයස් කාණ්ඩයන් අතර දක්නට ලැබේ.

## ආයතන පිළිබඳ විශ්වාසය

- රටේ පාලනයේ කාර්යභාරයක් ඉටු කරන ආයතන කිහිපයක් වන පාර්ලිමේන්තුව (22.4%), දේශපාලන පක්ෂ (19.0%), ජාතික ආණ්ඩුව (40.1%) සහ පළාත් පාලන ආණ්ඩුව (45.5%) සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ විශ්වාසය සැලකිය යුතු ලෙස අඩු බව දක්නට හැකිය. කෙසේ වෙතත්, විශාල බහුතරයක් අධිකරණය (79.2%), හමුදාව (84.5%) සහ පොලිසිය (66.9%) වැනි ආයතන කෙරෙහි වැඩි විශ්වාසයක් පළ කරන අතර, විශ්වාසයේ මට්ටම ද සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමකත් පවතී.

## සංහිඳියා සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය

- ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ කාලය තුළ සංහිඳියාව සඳහා වන ක්‍රියාවලිය ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් වත්මන් රජයේ ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (62.1%) අතෘප්තිමත් වේ. මෙම අතෘප්තිමත්භාවය සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන්, වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් හරහා දක්නට ලැබේ.

## බලය බෙදීම

- 'සමහර බලතල විමධ්‍යගත කළාට කමක් නැත, නමුත් මධ්‍යම ආණ්ඩුවේ බලතල අඩු නොකළ යුතුයි' යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න පිරිසක් (44.7%) සිය එකඟතාව පළ කරති. 'මධ්‍යම ආණ්ඩුවේ බලය අඩු කරන අතරම පළාත් සභාවලට බලය බෙදිය යුතුයි' යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් 35.6% ක් සිය එකඟතාවය ප්‍රකාශ කරති.
- සිංහල (33.4%) මලෙයහ දෙමළ (32.6%) සහ මුස්ලිම් ප්‍රජාවට සාපේක්ෂව දෙමළ (53.1%) ප්‍රජාව අතර 'මධ්‍යම ආණ්ඩුවේ බලය අඩු කරන අතරම පළාත් ආණ්ඩුවට බලය බෙදිය යුතුය' යන මතයට තරමක ඉහළ එකඟත්වයක් දක්නට ලැබේ. ඊට වෙනස්ව, 'මධ්‍යම ආණ්ඩුවේ බලතල අඩු නොකර යම් යම් බලතල විමධ්‍යගත කළාට කමක් නැත' යන මතයේ සිංහල ප්‍රජාවගෙන් අඩක් සිටින බව දක්නට හැකිය.

## නිරාගාමික ව්‍යවස්ථාව

- 'සෑම පුරවැසියෙකුගේම සමානාත්මතාවය සඳහා ඇති අයිතිය පවත්වා ගැනීම සඳහා, කිසිදු ආගමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රමුඛ ස්ථානය ලබා නොදිය යුතුය' යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න (52%) පිරිසක් සිය එකඟතාව පළ කරති.

- තවත් 42.2% ක පිරිසක් 'බහුතර ආගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රමුඛස්ථානය ලබා දීම කමක් නැත' යන ප්‍රකාශයට සිය එකඟතාව පළ කරති.
- 'පුරවැසියන්ගේ සමානාත්මතාවය සඳහා ඇති අයිතිය පවත්වා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ කිසිදු ආගමකට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු නැත' යන මතයට, සිංහල ප්‍රජාවට සාපේක්ෂව සුළුතර ප්‍රජාවන් (දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) අතර සැලකිය යුතු ලෙස ඉහළ එකඟත්වයක් පවතී. ඊට වෙනස්ව, 'බහුතර ආගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රමුඛස්ථානය ලබා දීම කමක් නැති බව' සිංහල ප්‍රජාවෙන් අඩකට ආසන්න පිරිසකගේ මතය වී තිබේ. මෙම මතය වැඩි වශයෙන් ප්‍රකාශ කරනු ලබන්නේ වැඩිහිටි ජනගහනය (අවුරුදු 30 ට වැඩි) විසිනි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය

- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව, ශ්‍රී ලාංකිකයන්ට මධ්‍යස්ථ දැනුවත්භාවයක් ඇති බව, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න (42.9%) පිරිසක් ඒ පිළිබඳව දැනුවත් බව ප්‍රකාශ කිරීමෙන් පිළිබිඹු වේ. ඒ අතරින්, සිංහල (40.4%) සහ මුස්ලිම් (35.7%) ප්‍රජාවන්ට වඩා දෙමළ (56.3%) සහ මලෙයහ දෙමළ (69.8%) ප්‍රජාවන් අතර දැනුවත්භාවය සැලකිය යුතු ලෙස ඉහළ ය.
- 'රටේ ජනවාර්ගික ගැටලුවට දේශපාලන විසඳුමක් ලබා දීම සඳහා සර්ව පාක්ෂික කමිටුවක් විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළ යුතුය' යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (72.3%) සිය එකඟත්වය පළ කරති. මෙම දෘෂ්ටිකෝණය සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන්, ස්ත්‍රී පුරුෂභාවයන් සහ වයස් කාණ්ඩ තුළ දක්නට ලැබේ.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් (52.3%) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය බව විශ්වාස කරන අතරම, 40%කට ආසන්න පිරිසක් වත්මන් ව්‍යවස්ථාව යම් යම් වෙනස්කම් සහිතව ඉදිරියට ගෙන යා යුතු බව විශ්වාස කරති. මෙම දෘෂ්ටිකෝණය සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් අඩක් තුළ දක්නට ලැබේ. කෙසේ වෙතත්, දැනට පවතින ව්‍යවස්ථාව යම් යම් වෙනස්කම් සහිතව ඉදිරියට ගෙන යා යුතු බව මලෙයහ දෙමළ ප්‍රජාවෙන් අඩකගේ අදහසයි.

## සුළුතරය - බහුතරය අතර සබඳතා

- 'මගේ වාර්ගිකත්වය නිසා මිනිසුන් බොහෝ විට මට වෙනස් ලෙස සලකයි' යන ප්‍රකාශය සමඟ කොපමණ දුරට එකඟ වන්නේ ද හෝ එකඟ නොවන්නේ ද යන්න සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිචාරකයින්ගෙන් විමසන ලදී. ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වැඩි පිරිසක් එම ප්‍රකාශය සමඟ එකඟ නොවන දක්වයි. මෙම මතය දෙමළ (56.3%) සහ මලෙයහ දෙමළ (47.6%) ප්‍රජාවන්ට වඩා සිංහල (70.3%) සහ මුස්ලිම් (78.6%) ප්‍රජාවන් අතර සැලකිය යුතු ලෙස ඉහළ ය.
- වෙනත් ජනවර්ගයකට අයත් පුද්ගලයන් සමඟ ඔවුන් කොපමණ වාරයක් අන්තර් සබඳතා පවත්වන්නේ දැයි විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න (48%) පිරිසක් ප්‍රකාශ කළේ තමන් "බොහෝ විට" වෙනත් ජනවර්ගවලට අයත් පුද්ගලයන් සමඟ සබඳතා පවත්වන බවයි. මලෙයහ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර මෙම අදහස  සාපේක්ෂව ඉහළ ය. වෙනත් ජනවර්ගවල පුද්ගලයන් සමඟ අන්තර් සබඳතා පවත්වන්නේ "කලාතුරකින්" බව සිංහල සහ දෙමළ ප්‍රජාවෙන් ආසන්න වශයෙන් 30%ක් ප්‍රකාශ කරයි. 'බොහෝ විට' වෙනත් ජනවර්ග සමඟ අන්තර් සබඳතා පවත්වන බව ප්‍රකාශිත පිරිස අතරින්, ස්ත්‍රීන් සමඟ සැසඳීමේදී පුරුෂයින් සාපේක්ෂ වශයෙන් ඉහළ ය.
- ශ්‍රී ලංකාවේ අනෙකුත් ජනවර්ග පිළිබඳව ඔවුන් සතුව ඇති දැනුමේ ප්‍රමාණය ගැන විමසූ විට, 'ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා වැඩි (57%) පිරිසක් ප්‍රකාශ කරන ලද්දේ ඔවුන්ට යම් දැනුමක් ඇති බවයි. මෙම මතය සියලුම ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම්, වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවයන් තුළ දක්නට ලැබේ.
- සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් ඔවුන් ජීවත් වන ප්‍රජාවන් තුළ ඔවුන්ගේ ආගම ඇදහීමට ඇති නිදහස පිළිබඳව විමසන ලදී. ප්‍රතිචාර දැක්වූ ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (95.6%) ප්‍රකාශ කළේ ඔවුන්ට කිසිදු සීමාවකින් තොරව තම ආගම ඇදහීමට හැකි බවයි. මෙම මතය සියලුම ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම්, ආගමික කණ්ඩායම් සහ වයස් කාණ්ඩවල මෙන්ම ස්ත්‍රී පුරුෂ භාවයන් තුළ ද දක්නට ලැබේ.

කෙසේ වෙතත්, ශ්‍රී ලාංකිකයින්ගෙන් 3.7% ක් ප්‍රකාශ කළේ ඔවුන්ට තම ආගම ඇදහීමට හැකි නමුත් යම් සීමාවන් ඇති බවයි.

## සමාජ විශ්වාසය

- සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් පුද්ගලික උපකාරයක් ලබා ගැනීමට අවශ්‍ය වු විට අසල්වාසීන්, ඥාතීන් සහ විවිධ ජාතීන් කොතරම් දුරට විශ්වාසය කරන්නේද යන්න පිළිබඳව විමසන ලදී. යම් අවස්ථාවක දී උපකාරයක් අවශ්‍ය වු විට තම අසල්වැසියන් (86%) හෝ ඥාතීන් (91.2%) විශ්වාස කරන බව බහුතරයක් ප්‍රකාශ කළහ. තව ද, උපකාරයක් ලබා ගැනීමේදී සිංහල (85.4%), දෙමළ (69.3%) සහ මුස්ලිම් (64.1%) ප්‍රජාවන්ගෙන් කෙනෙක්ව විශ්වාස කරන බව ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ප්‍රකාශ කරයි.
- කෙසේ වෙතත්, සිංහල ප්‍රජාවගෙන් උපකාරයක් ලබා ගැනීමට කැමති පිරිස දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් උපකාර ලබා ගැනීමට කැමති පිරිසට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් දෙස බලන විට, එක් එක් ජනවාර්ගික කණ්ඩායමෙන් අතිමහත් බහුතරයක් තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවගෙන් උපකාර ලබා ගැනීමට කැමැත්තක් දක්වයි.

## සුළු ජාතීන් සඳහා වන දේශපාලන ආරක්ෂාව

- "ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුයි" යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (90.9%) සිය එකඟතාව පළ කරති. මෙම අදහස සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන්, වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවයන් තුළ දක්නට හැකිය.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (79.5%) "සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය" යන ප්‍රකාශය සමග එකඟ වේ. මෙම මතය සියලුම ජනවාර්ගික ප්‍රජාවන් තුළ දක්නට ලැබුන ද අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සාපේක්ෂව සිංහල ප්‍රජාව අතර සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක එකඟතාවයක් දක්නට ලැබේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගම සඳහන් කිරීම පිළිබඳ විමසූ විට, ශ්‍රී ලාංකිකයන් මිශ්‍ර අදහස් පළ කරති. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආගමික නිදහස මූලික අයිතිවාසිකමක් ලෙස ආරක්ෂා කළ යුතු බව ශ්‍රී ලාංකිකයන්ගෙන් 30%ක් ප්‍රකාශ කරයි. තවත් 30%කට ආසන්න පිරිසක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුද්ධාගමට පමණක් විශේෂ ස්ථානයක් දෙන අතර, අනෙක් සියලු ආගම්හි නිදහස සහතික කළ යුතු බව දක්වයි. තව ද, තවත් 20% කට ආසන්න පිරිසක් පවසන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සියලු දෙනාටම තම ආගම ඇදහීමේ නිදහස සහතික කිරීම හැර, ආගම පිළිබඳ සඳහනක් නොතිබිය යුතු බවයි.
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සියලු දෙනාටම ආගම ඇදහීමේ නිදහස සහතික කිරීම හැර ආගම පිළිබඳ සඳහනක් නොතිබිය යුතු යැයි විශ්වාස කරන පිරිස අතර සුළුතර වාර්ගික ප්‍රජාවන් (දෙමළ, මලෛයහ දෙමළ සහ මුස්ලිම්) සැලකිය යුතු ලෙස ඉහළ ය. ඊට ප්‍රතිවිරුද්ධව, සිංහල ප්‍රජාව මේ පිළිබඳ මිශ්‍ර මත ප්‍රකාශ කරයි.

## ජාතික ගීය ගායනා කිරීමේ භාෂාව

- "ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කළ යුතුය" යන ප්‍රකාශයට ප්‍රතිචාරකයින්ගේ එකඟතා මට්ටම ගැන විමසූ විට, ශ්‍රී ලාංකිකයින්ගෙන් 60% ක් එයට එකඟතාව ප්‍රකාශ කරන අතර, 30% කට වඩා තරමක් වැඩි පිරිසක් එකඟ නොවන බව ප්‍රකාශ කරයි. ජාතික ගීය භාෂා දෙකෙන්ම ගායනා කළ යුතු යැයි සිතන පිරිස අතර සුළුතර ප්‍රජාවන් සැලකිය යුතු ලෙස ඉහළ ය. ඊට ප්‍රතිවිරුද්ධව, සිංහල ප්‍රජාවගේ මෙම ප්‍රකාශයට එකඟ වීම බෙදී පවතින බව දක්නට ලැබේ.
- මෙම ප්‍රකාශය සමග එකඟතාව පළ කරන පිරිසෙන්, තරුණ වයස් කාණ්ඩය (අවුරුදු 18-29) සාපේක්ෂ වශයෙන් ඉහළ ය.


## සිහි කිරීමට ඇති නිදහස

- "සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට වසර 30ක යුද්ධය හේතුවෙන් මියගිය අය සිහිපත් කිරීමේ අයිතිය සම්බන්ධයෙන් රජය විසින් පනවා ඇති කොන්දේසිවලට යටත්ව සිහිපත් කිරීමට සියලු ජනවර්ගවලට නිදහස තිබිය යුතුය" යන ප්‍රකාශයට ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (47.8%) එකඟතාවය පළ කරති. තවත් අඩකට ආසන්න ශ්‍රී ලාංකිකයන් (47.2%) "30 වසරක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස මියගිය අය සිහිපත් කිරීමට සියලු ජනවර්ගවලට නිදහස ලබා දිය යුතුය" යන ප්‍රකාශය සමඟ එකඟත්වය පළ කරයි.
- "30 වසරක යුද්ධයෙන් මියගිය අය සිහිපත් කිරීමට සියලු ජනවර්ගවලට නිදහස දිය යුතුයි" යන ප්‍රකාශය සමඟ එකඟතාව පළ කරන පිරිස අතර දෙමළ (76.8%) සහ මලෙයහ දෙමළ (67.4%) ප්‍රජාවන් අතර සහ තරුණ ජනගහනය (අවුරුදු 18-29) අතර ද සාපේක්ෂව ඉහළ ය. අනෙක් අතට සිංහල ප්‍රජාවගේ මතය මෙම ප්‍රකාශ දෙක අතර බෙදී ඇත.


# සොයාගැනීම්

# ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය


## ප්‍රස්තාර 1 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ජාතික




## ප්‍රස්තාර 2 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාර 3 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස




## ආයතන පිළිබඳ විශ්වාසය

ප්‍රස්තාර 4 - ආයතන පිළිබඳ විශ්වාසය - ජාතික




වගුව 1 - ආයතන පිළිබඳ විශ්වාසය - ජනවාර්ගිකත්වය


| | සිංහල | දෙමළ | මලෙයහ දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|
| ජාතික ආණ්ඩුව | 35.2% | 57.1% | 67.4% | 51.2% |
| මගේ පළාත් සභාව/ ආණ්ඩුව | 40.9% | 63.4% | 67.4% | 54.8% |
| මගේ පළාත් පාලන ආණ්ඩුව | 50.0% | 71.4% | 69.0% | 69.9% |
| සිවිල් සේවය/ රාජ්‍ය සේවය | 71.6% | 84.8% | 76.7% | 70.2% |
| පොලිසිය | 66.5% | 72.3% | 71.4% | 60.7% |
| හමුදාව | 90.9% | 62.5% | 69.8% | 61.4% |
| අධිකරණය | 78.2% | 87.6% | 90.5% | 72.6% |
| පාර්ලිමේන්තුව | 13.8% | 56.3% | 58.1% | 41.0% |
| දේශපාලන පක්ෂ | 13.1% | 42.9% | 42.9% | 31.3% |
| මැතිවරණ කොමිසම | 46.0% | 64.3% | 76.2% | 45.8% |
| රාජ්‍ය නොවන සංවිධාන | 44.6% | 69.6% | 78.6% | 57.1% |

## සංහිඳියාව පිළිබඳ ප්‍රගතිය


ප්‍රස්තාර 5 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ජාතික



ප්‍රස්තාර 6 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාර 7 - සංහිඳියාව ආමන්ත්‍රණය කිරීමේ ප්‍රගතිය පිළිබඳව තෘප්තිමත් වීම - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස




# බලය බෙදීම


ප්‍රස්තාරය 8 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ජාතික




ප්‍රස්තාරය 9 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාරය 10 - පළාත් සභාවට බලය බෙදා හැරීම සඳහා සහාය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





## නිරාගාමික ව්‍යවස්ථාව


ප්‍රස්තාරය 11 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ජාතික



ප්‍රස්තාරය 12 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාරය 13 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමේ තත්වය පිළිබඳ මතය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස




## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය


ප්‍රස්තාරය 14 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ජාතික





ප්‍රස්තාරය 15 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය




### ප්‍රස්තාරය 16 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





### ප්‍රස්තාරය 17 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ජාතික




## ප්‍රස්තාරය 18 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ජනවාර්ගිකත්වය





## ප්‍රස්තාරය 19 - දේශපාලන විසඳුමක් පිළිබඳ මහජන මතය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස




ප්‍රස්තාරය 20 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ජාතික




ප්‍රස්තාරය 21 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාරය 22 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට සහාය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





## සුළුතරය - බහුතරය අතර සබඳතා


ප්‍රස්තාරය 23 - "මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි" - ජාතික




ප්‍රස්තාරය 24 - "මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි" - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාරය 25 -"මගේ ජනවාර්ගිකත්වය නිසා මිනිසුන් විටින් විට මට වෙනස් ලෙස සලකයි" - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස




ප්‍රස්තාරය 26 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ජාතික





ප්‍රස්තාරය 27 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාරය 28 - වෙනත් ජනවර්ගයකට අයත් අයෙකු සමඟ ඔබට කොපමණ වාරයක් අන්තර් සබඳතා පැවැත්වීමට සිදුවනවා ද? - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





ප්‍රස්තාරය 29 - ඔබට හැඟෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ජාතික




ප්‍රස්තාරය 30 - ඔබට හැගෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාරය 31- ඔබට හැගෙන පරිදි, ශ්‍රී ලංකාවේ වෙනත් ජනවර්ග පිළිබඳව කොපමණ දැනුමක් ඔබට තිබෙනවාද? - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස




ප්‍රස්තාරය 32 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ජාතික





ප්‍රස්තාරය 33 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ජනවාර්ගිකත්වය



ප්‍රස්තාරය 34 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද?- ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





ප්‍රස්තාරය 35 - ඔබේ ප්‍රජාව තුළ ඔබේ ආගම ඇදහීමට කොතරම් නිදහසක් තිබේදැයි ඔබ සිතනවාද? - ආගම




## සමාජ විශ්වාසය

ප්‍රස්තාරය 36 - ඔබට පුද්ගලික උපකාරයක් උවමනා අවස්ථාවකදී, ඒවැනි උපකාරයක් ලබා ගැනීමට පහත සදහන් කර ඇති පුද්ගලයින්ව ඔබ කොතරම් දුරට විශ්වාස කරනවා ද? - ජාතික





ප්‍රස්තාරය 37 - ඔබට පුද්ගලික උපකාරයක් උවමනා අවස්ථාවකදී, ඒවැනි උපකාරයක් ලබා ගැනීමට පහත සදහන් කර ඇති පුද්ගලයින්ව ඔබ කොතරම් දුරට විශ්වාස කරනවා ද? - ජනවාර්ගිකත්වය




## සුළු ජාතීන් සඳහා වන දේශපාලන ආරක්ෂාව


ප්‍රස්තාරය 38 - ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ජාතික





ප්‍රස්තාරය 39 - ප්‍රදේශයේ සිටින බහුතරය එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාරය 40 - ප්‍රදේශයේ සිටින බහුතරය  එකඟ නොවුණත්, සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





ප්‍රස්තාරය 41 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ජාතික




ප්‍රස්තාරය 42 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාරය 43 - සෑම ජනවර්ගයකටම පාර්ලිමේන්තුවට නිශ්චිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතුය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස




## ප්‍රස්තාරය 44 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ජාතික




## ප්‍රස්තාරය 45 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ජනවාර්ගිකත්වය




ප්‍රස්තාරය 46 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ආගමට ඇති තත්වය - ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස





## ජාතික ගීය ගායනා කිරීමේ භාෂාව


ප්‍රස්තාරය 47 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ජාතික



ප්‍රස්තාරය 48 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ජනවාර්ගිකත්වය





ප්‍රස්තාරය 49 - ජාතික ගීය සිංහලෙන් සහ දෙමළෙන් ගායනා කිරීමට ඇති සහාය - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස




# සිහි කිරීමට ඇති නිදහස


ප්‍රස්තාරය 50 - සිහිකිරීමට ඇති නිදහස - ජාතික




ප්‍රස්තාරය 51 - සිහිකිරීමට ඇති නිදහස - ජනවාර්ගිකත්වය



## ප්‍රස්තාරය 52 - සිහිකිරීමට ඇති නිදහස - ස්ත්‍රී පුරුෂභාවය සහ වයස



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනයඃ නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.

දුරකථනඃ +94(11)2081384-6

වෙබ්ඃ http://www.cpalanka.org


සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.


ලිපිනයඃ නො. 6/1B,1/1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.

දුරකථනඃ +94 11 2584050

වෙබ්ඃ www.cpalanka.org.survey-research